

## මිණි කිරණින් එළිය වන තිස්සමහාරාම වෙහෙර

### ⁘ පරලොව නෑදෑයෝ

– නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි
පොසොන් පුර අටවක පෝද ධර්ම දේශනාවයි. බොහෝ පින්දහම් කරමින් යහපත් ජීවිතයක් ගත කළ තැනැත්තාට තමන් විසින් එසේ සිදුකරන ලද පින්කම් පරලොවදී සුවදායක අත්දැකීම් රුසකට මග පාදන බව අලංකාර උපමාවක් සහිතව පෙන්වා දුන් බුද්ධ දේශනාවකට අර්ථකථනයකි.

### ⁘ නුවණින් දැකිය යුතු ජීවිත යථාර්ථ

'දම්සක් මැදුර' විශේෂාංගය යටතේ ජීවිතය පිළිබඳ යථාර් ථවාදී දෘෂ්ටියක් හෙළන බෞද්ධ දර්ශනයේ සඳහන් වන ආර්ය සත්‍ය සත– රෙන් පළමුවැනි ආර්ය සත්‍යය වූ දුක්ඛ ආර්ය සත්‍යය පිළිබඳ විමර්– ශනයකි. ප්‍රකට විද්වත් හිමිනමක් සමග සාකච්ඡා කොට බෞද්ධ දර්ශනය පිළිබඳ ඉදිරිපත් කැරෙන ලිපි පෙළක තුන් වැනි ලිපිය.

### ⁘ ජීවිත ගසෙන් නෙළිය යුතු අමා ඵලය

– මනෝජ් සමරසිංහ
මිනිස් ජීවිතයක උපරිම ඵල ලැබෙන ආකාරයට දහම සමග පුද්– ගලයා සම්බන්ධ විය යුත්තේ කෙසේද,'යි සාකච්ඡා කැරෙන කෙටි ලිපියකි. සීල – භාවනා ආදී පිළිවෙත් වල නිසි ඵල ලැබෙන ධර්මා– නුකූල ක්‍රියාමාර්ගය කෙබඳු ද,'යි පහදා දීම – ලේඛකයාගේ අරමුණ වී ඇති බව පෙනේ.

### ⁘ සපුගහතම්මිට ශ්‍රී බෝධි අංගනාරාමය

'වෙහෙර විහාර' විශේෂාංගය යටතේ සියවස් හයක් පමණ පැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු ඇතුළත් ලිපියකි. මරඳගහමුල – බඩල්ගම පාරේ කිලෝ මීටර් තුනක් පමණ දුරින් හුණුමුල්ලේ තම්මිටකන්ද උඩින් දකුණට හැරී කිලෝමීටර් එකක් පමණ ගිය විට මෙම විහාරස්ථානය හමු වේ.

### ⁘ සොබා දහමයි ඔබේ වගකීමයි

– බෙලිගල්ලේ ධම්මජෝති හිමි
සොබා දහමේ විවිධ හැසිරීම් බුදු ඇසින් දුටු අයුරු ද – ඒ පිළිබඳ මිනිසා සතු වගකීමේ ස්වභාවය ද පැහැදිලි කර ගැනීම ලේඛකයාගේ අරමුණ බව පෙනේ. විවිධ අදූරදර්ශී ප්‍රතිපත්ති මගින් මිනිසා තමන්ගේ විනාශය තමන් විසින් ම ළඟා කර ගනිමින් සිටින අයුරු පැහැදිලි කිරීමට දරන ප්‍රයත්නයක් ලෙස මෙම ලිපිය සැලකිය හැකිය.

### ⁘ අවසන් මොහොතේ සිත් සැනසුමට දෙගුරුනට ඔවදනක්

– ආචාර්ය එස්.අයි. ගමගේ
වර්තමාන සමාජයේ ඇතැම් මවුපියන් – තමන්ගේ දරුවන්ගේ සද– වාරාත්මක දියුණුව පිළිබඳ දක්වන අවධානය ප්‍රමාණවත් නොවන බව. පැරැණි දහම් පොත පත භාවිතය සහ වැඩිහිටි ආදර්ශය දරු– වන්ගේ පෞරුෂ වර්ධනයට; සාමකාමී සමාජයක උදවට හේතු වන ප්‍රබල සාධක දෙකක්බව.

### ⁘ අමා මගකට නුවන් යොමු කළ අමා සෙනෙහස

– ආරියරත්න ලොකුගම්හේවා
බෞද්ධ කෙටිකතාවකි. තමන්ගේ යහගුණැ'ති මවගේ වියෝවෙන් පසු ඇය සතුව තිබූ උතුම් ගුණ ධර්ම පිළිබඳ සහ ඇගේ වියෝව නිසා තමන් තුළ ඇතිවූ වේදනාව විදර්ශනා භාවනාවක් බවට හරවා ගෙන – විමුක්ති මගට තමන්ගේ සිත යොමු කර ගත් දරු– වකු පිළිබඳ රසවත් ප්‍රබන්ධයකි.

### ⁘ Buddhism in Day-to-Day Life

*-by Late Ven Ariyawansa Nayaka Maha Thera*